3 වන පිටෙන්

තිබුණ ද "දැන් තිබෙන රට" යුද්ධය තිබුණු රටට වඩා හොඳ ය...

## රෙජීමය හෙවත් බූවලූකරණය

පශ්චාත් යුධ වාතාවරණය තුළ පාලක රෙජීමය හෙවත්




රාජපක්ෂ පවුල, රෙජීමයේ කොටස් වන ඇමතිවරුන් සහ පුතුන්, යාන්ත්‍රණයේ ඉහළ සිට පහළට ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු හා සභාපතිවරු මෙන්ම මැරවරයින් සහ චණ්ඩින් ගේ හැසිරීම පුළුල් තිරයක දක්වා, ඒ තුළ දෙමළ සිංහල මුස්ලිම් සාමාන්‍ය ජනතාවගේ තත්ත්වය ද ස්ථානගත කළහොත් දක්නට ලැබෙන්නේ කුමක්ද? බේරුවල අලූත්ගම වෙරළ තීරයේ හෝටල්වල අලූත් හිමිකාරීත්වය විමසා බැලීමම මෙහි රුදුරු බව සනාථ කරනු ඇත. එම හෝටල් බහුතරයක් රාජපක්ෂ පවුල විසින් මිළ දී ගෙන ඇති අතර ලංකාව පුරා අභයභූමි, වෙරළ සංරක්ෂණ තීරයන් ද ඇතුළුව සෑම තැනකම දේපළ අයත් කර ගෙන ඔවුන්ගේ නමින් හෝටල් ඉදිවෙයි. ඒවා ඉදි වනුයේ පොලිස්, එස්.ටී.එෆ්. හෝ යුධ හමුදා ආරක්ෂාව මැද ය. කොළඹ මැද අක්කර ගණනාවක් යොදවමින් ඉදිවන ඬසුපිරි කැසිනෝ ලෝකයඬ, ප්‍රශ්ණ කිරීම්වලට පවා ලක් නොවන තරම් සාමාන්‍ය ජනතාවගෙන් දුරය. කොළඹ ඉදිකළ ජොගිං පාත්වල තත්ත්වය ද මීට නොදෙවෙනි වන අතර ඉදින් ඔබ එහි සුව විඳීමට යන්නේ නම් මීටර් දහයෙන් දහයට හිටගෙන සිටින යුධ හමුදා සෙබළුන් අතර මැද එය විඳ ගත යුතුය. කොළඹ මැද ඉඩම් කීයක් මේ වන විට ආරක්ෂක ලේකම්වරයා යටතේ ඇති ආරක්ෂක අමාත්‍යංශය සහ නාගරික සංවර්ධන අමාත්‍යංශය යටතට ගෙන ඇත්දැයි බැලූවහොත් වසර ගණනක් තිස්සේ වෙසක් තොරණ ඉදිකළ බොරැල්ල මංසන්ධියේ හිස් ඉඩම, විහාරමහා දේවී උද්‍යානයේ එළිපෙහෙළි කිරීම්, සතුටු උයන ඉවත් කිරීම, බන්ධනාගාර නගරවලින් ඉවත් කිරීම ආදී මේ සියල්ල නගර සංවර්ධනයේ මුවාවෙන් කෙරෙන දේපළ අයත් කර ගැනීම් බව ඉතා පැහැදිළි කරුණකි. මින් අමතරව රටපුරා බලහත්කාරයෙන් කුණුකොල්ලයට අයත් කර ගත් නිවෙස් සහ හෝටල් * ඒවා විකුණා දැමීමට හිමික-රුවන්හට බලපෑම් කෙරෙන අයුරු* මේවා ප්‍රසිද්ධ රහස් ය. මේ සියල්ල කෙරෙන්නේ (ඒ ඔබ පෙම් කළ) ආරක්ෂක අංශවල ආරක්ෂාව සහිතවය.

නීතිය වෙනත් ඕනෑම ඒකාධිපති රටක සිදුවන පරිදි විධායකයට අවැසි පරිදි හැසිරෙන ලෙස සකස් කර ඇති අතර ඉතිහාසයේ නොවූ විරූ ලෙස විලිලැජ්ජාවකි-න් තොරව එය අපරාධකරුවන්ට භාර දී ඇත. නඩු අසන අපරාධකරුවන් විසින් විත්තිකාර අපරාධකරුවන් නිදහස් කරන අතර සාමාන්‍ය ජනතාවගේ පැමැණිලි ලියා ගැනීමකින් පවා තොරව හරවා යවනු ලැබේ. රෙජීමයේ ම හෙංචයියන්ගෙන් පීඩනයට පත්ව සාධාරණය බලාපොරොත්තු වන විදේශිකයන්ගේ සිට මහ ජාතික සිංහලයා දක්වා නීතිය ඉදිරිපිට පොල් කුඩු බවට පත් වෙති. දුමින්ද සිල්වා ඇප ලැබූ විගස හාස-"කමකින් සුව වී අරලිය ගහ මන්දිරයට ගොස් ජනාධිපතිට වැඳ ආශිර්වාද ලබා ගැනීම එහි ආසන්නතම කූඨප්‍රාප්තිමය අවස්ථාවයි.

මැරයින්ගෙන්, සොරුන්ගෙන්, දූෂකයින්ගෙන් පිරුණු ව්‍යවස්ථාදායකය හෙවත් පාර්ලිමේන්තුවේ සිට ප්‍රාදේශීය සභා දක්වා එළියේ හැසිරෙන ආකාරය පාලනය කිරීමට මහින්ද චින්තනයට අවශ්‍ය නැත. මර්වින් සිල්වාට තමන්ට රිසි දෙයක් කොට මාධ්‍ය ප්‍රකාශ නිකුත් කළ හැකි අතර මාලක සිල්වා ට රඹුක්වැල්ල පුතාට මෙන්ම ජනපති පුතුන්ට ද කැමති තැනක කැමති කෙනෙකුට (හාස්‍යජනක ලෙස * යුධ හමුදාවට වුව) පහර දීමේ, කැමති පරිදි මිනිසුන් වාහනවලින් හප්පා දමා යාමේ හා කැමති ගොන් පාට් එකක් කිරීමේ ශුද්ධ වූ අයිතියක් ඇත. ඔවුන්ට (තාත්තලා ට මෙන්ම) කැමති නිළියක් හෝ තරුණියක් පාවිච්චි කළ හැකි අතර ඒ සමූහ ක්‍රියා අතරතුර මතුවන හදිසි අවස්ථාවලදී ලංකාවේ ඕනෑම රෝහලක වෛද්‍යවරයෙක් රෑ නිදිමරාගෙන තරුණියට හෝ නිළියට හදිසි ප්‍රතිකාර කිරීමට සැරසී සිටිය යුතුය. මේ සියලූ ඇමතිවරුන්ව ආරක්ෂක අංශ විසින් කොන්දේසි විරහිතව රකිනු ලැබෙයි.

රටෙහි අන් සියලූ අංශ, අධ්‍යාපනය, පරිපාලනය, ව්‍යාපාර දිනෙන් දින පිරිහෙන අතර ඒවා යළි යළිත් උම්මත්තක ඇමතිවරුන් අතින් කෙළෙසෙමින් පවතියි. මෙහි ප්‍රතිඵලය කුමක්ද? විනයක් නැති, හෘදය සාක්ෂියක් නැති පුරවැසියන් පිරි රටකි. ඔබ දැන් ජීවත් වන්නේ, පෙර කිසිදාකට වඩා ස්ත්‍රී දූෂණ, ළමා අපචාර, සිය දිවිනසා ගැනීම්, අපරාධ, මංකොල්ලකෑම් වලින් පිරි සසිරිබර රටකය. ගුරුවරු හිටගෙන කරන විට ගෝලයෝ දුව දුව කරති

මේවා සිදුවන්නේ පශ්චාත් යුධ ලංකාවේ මහ ජාතිය වන සිංහලයා ට ය. ඒ වුනත් දෙමළාට හා මුසල්මානුවාට කෙළ වූ නිසා මේ රට සිංහලයාට හොඳ ය....

## වැලිවේරිය - රතුපස්වල සිද්ධිය, යුධ හමුදාව සහ ජනතාව

හමුදාවක ප්‍රධාන කාර්යය වන්නේ අණ පිළිපැදීම යි. ඉතිහාසය පුරා සිදුවූ ශිෂ්‍ය නැගිටීම්වලට පහර දීම සඳහා රජයන් හමුදාව යොදාගත් අතර 71, සහ 89 තරුණ නැගිටීමවල ප්‍රධාන මර්ධන යාන්ත්‍රණය වූයේ ද එයයි. සාධාරණය ඉල්ලා කරන සාමකාමී පා ගමනක සිට උද්ඝෝෂනයක් දක්වා කවරාකාරයේ වුව ජනතා හඬක් නිහඬ කිරීමට යොදා ගන්නා අවිය ත්‍රිවිධ හමුදාව හා පොලීසිය යි. යුධ හමුදාව උතුර නැගෙනහිර සිවිල් වැසියන් යුද්ධයේ නාමයෙන් මරා දමන විට හුරේ දැමූ ජනතාවට අමතක වූ කරුණ නම් ඉතිහාසය තුළ දෙවරක්ම දස දහස්

9 වන පිටට




සන්නස Cartoon by PK




PK ගේ කාටුන් රසවිඳින්නට දිනපතා www.sannasa.net අඩවියට ගොඩවන්න